**සත්වෝද්‍යාන සංවර්ධන හා සුභසාධක අරමුදල - 2015**

---

සත්වෝද්‍යාන සංවර්ධන හා සුභසාධක අරමුදලේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1982 අංක 41 දරන ජාතික සත්වෝද්‍යාන පනතේ 8(5) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. අරමුදලේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට සත්වෝද්‍යාන සංවර්ධන හා සුභසාධක අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 ප්‍රකාරව දේපල, පිරියත හා උපකරණ ක්ෂය කිරීමේදී එම එක් එක් වත්කමෙහි ප්‍රයෝජනවත් ජීවිත කාලය නොසලකා සමස්ථ වටිනාකම පදනම් කර ගෙන ක්ෂය කිරීම් සිදුකර තිබුණි.

2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

සමාලෝචිත වර්ෂයේ ජංගම නොවන වත්කම් යටතේ ප්‍රදර්ශනය සඳහා වූ සතුන් රු.980,835,650 ක් ලෙස වර්තමාන වටිනාකමට දක්වා තිබුණද එම වත්කම් තක්සේරු කිරීමට යොදාගත් නිර්ණායක ගිණුම් ප්‍රතිපත්ති වලින් හෙළිදරව් කර නොතිබුණි.

**2.2.3 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළ පිළිවෙලින් දෙහිවල සත්ව උද්‍යානය හා රිදියගම සෆාරි උද්‍යානයේ පුස්තකාල සඳහා මිලදී ගන්නා ලද රු.59,551 ක් හා රු.36,327 ක් වටිනා පොත්, වත්කම් ලෙස ගිණුම්ගත නොකර විවිධ වියදම් යටතේ ගිණුම් ගත කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉතිරි සත්ව ආහාර තොගය ගණනය කර ගිණුම් ගත කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට ප්‍රයෝජනවත් තත්ත්වයට පත් කර තිබූ හා අරමුදල විසින් මෙහෙයුම් කටයුතුවලට යොදාගෙන තිබූ එකතුව රු.490,282,904 ක වත්කම් ප්‍රාග්ධනීත කිරීම වෙනුවට කෙරීගෙන යන වැඩ ලෙස දක්වා තිබීම හේතුවෙන් ඒමත ක්ෂයවීම් ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) සෆාරි සහ සත්ව උද්‍යාන අරමුදල වෙනුවෙන් සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව වැය කළ රු 10,301,650 ක් අරමුදල වෙත පවරාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) 2015 දෙසැම්බර් 31 දිනට පිළියෙල කළ බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව රු.72,196,556 ක හඳුනානොගත් ගෙවීම් හා රු.360,590 ක හඳුනානොගත් ලැබීම් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි.

### 2.2.4 පැහැදිලි නොකළ වෙනස්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල උපචිත විවිධ වියදම් රු.1,424,798 ක් වූ අතර අරමුදලේ වැය ලෙජරය අනුව රු.1,830,882 ක් වූයෙන් රු.406,084 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව ඉදිකිරීම් 06 කට අදාල කෙරීගෙන යන වැඩ වටිනාකම රු.135,737,022 ක් වූ අතර ඒවාට අදාල උපලේඛනය අනුව එය රු.93,176,728 ක් වූයෙන් රු.42,560,294 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) සමාලෝචිත වර්ෂයේ භාණ්ඩාගාර තැන්පත් ගිණුමේ ආරම්භක ශේෂය සහ දෙසැම්බර් 31 දිනට අවසාන ශේෂය පිළිවෙලින් රු.1,432,763,200 ක් හා රු.1,842,490,560 ක් වූ අතර අරමුදලේ ශේෂ පත්‍රය අනුව ආරම්භක ශේෂය හා දෙසැම්බර් 31 දිනට අවසාන ශේෂ පිළිවෙලින් රු.1,431,478,742 ක් හා රු.1,849,298,100 ක් වූයෙන් පිළිවෙලින් රු.1,284,458 ක හා රු.6,807,540 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

| **විෂයය** | **වටිනාකම රු.** | **ඉදිරිපත් නොවූ සාක්ෂි** |
|---|---|---|
| ආදායම්,වියදම්,වත්කම් හා වගකීම් | 4,833,084,966 | පොදු ලෙජර් ගිණුම් හා ජර්නල් සටහන් |
| නොනිමි වැඩ | 1,290,924,857 | විස්තරාත්මක කොන්ත්‍රාත් ගෙවීම් ලේඛනය |
| ණයහිමියන් | 340,982 | විස්තරාත්මක ලේඛන හෝ උපලේඛන හා කාල විශ්ලේෂණ |

| | | |
|---|---|---|
| ප්‍රදර්ශන සතුන් | 980,835,650 | වර්තමාන සත්ව වටිනාකම් ඇතුළත් ස්ථාවර වත්කම් ලේඛනය |
| දේපල පිරියත හා උපකරණ | 217,513,175 | ස්ථාවර වත්කම් ලේඛනය |
| පෙර වර්ෂ ගැලපීම් | 484,820 | ජ'නල් සටහන් |

**2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත සඳහන් අනුකූල නොවූ අවස්ථා නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1982 අංක 41 දරන ජාතික සත්වෝද්‍යාන පනත | |
| 8(3)(අ) වගන්තිය | සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ සේවය කරන රජයේ නිලධාරීන්ට රු.22,134,258 ක දිරි දීමනාවක්ද, රු.3,522,050 ක විදේශ පුහුණුවක්ද, රු.10,000 ක දේශීය පුහුණුවක් හා රු.451,040 ක සේවක සුභසාධන වියදම් සමාලෝචිත වර්ෂයේදී අරමුදලෙන් දරා තිබුණි. |
| 9(1) වගන්තිය | සත්වෝද්‍යානය සම්බන්ධයෙන් වූ සියලු කාරණා හා ප්‍රශ්න පිළිබඳව අධ්‍යක්ෂවරයාට උපදෙස් දීම හා අමාත්‍යවරයා වෙත නිර්දේශයන් කිරීමේ කාර්යය සඳහා සභාපතිවරයා වශයෙන් අධ්‍යක්ෂවරයාගෙන්ද වෙනත් තැනැත්තන් එකොලොස් දෙනෙකුගෙන්ද සමන්විත වන්නා වූ උපදේශක කාරක සභාවක් අමාත්‍යවරයා විසින් පත්කරනු ලැබිය හැකිය. එසේ උපදේශක කමිටුවක් පිහිටුවා නොතිබුණි. |
| 9(2) වගන්තිය | උපදේශක කාරක සභාවේ රැස්වීම් යටත් පිරිසෙන් සෑම වර්ෂයකටම දෙවරක් පැවැත්විය යුතු වුවත් එසේ රැස්වීම් පවත්වා නොතිබුණි. |
| 14 වන වගන්තිය | පනත අනුව ජාතික සත්වෝද්‍යානය යන අර්ථකථනයට අදාල නොවන වාගොල්ල සත්ත්ව උද්‍යානය, හම්බන්තොට රිදියගම සෆාරි උද්‍යානය සහ කහපොල පාරිසරික උද්‍යානය සඳහා නීතිමය විධිවිධාන නොමැතිව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා රු.2,541,875,764 ක වියදම් දරා තිබුණි. |

| | |
|---|---|
| (ආ) 2006 ජනවාරි 25 දිනැති රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | 2013 ජනවාරි මාසයේ සිට 2015 දෙසැම්බර් 31 දින දක්වා රු.3,214,302 ක් වටිනා මත්ස්‍ය ආහාර ප්‍රසම්පාදන ක්‍රියාවලියකින් තොරව හා තත්කාර්ය අත්තිකාරම් පදනමින් විවෘත වෙළඳපොලෙන් මිලදී ගෙන තිබුණි. මෙම අත්තිකාරම් මුදල් විධිමත් ලියකියවිලි ඉදිරිපත් කිරීමකින් තොරව පියවා තිබුණි. |
| (ඇ) 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත | සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ ගෙවීම්වලට අදාල එකතු කළ අගය මත බදු මුදල් රු.33,103,307 ක් සත්වෝද්‍යාන සංවර්ධන හා සුහසාධන අරමුදල යටතේ සටහන් කර තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

---------------------

### මූල්‍ය ප්‍රතිඵල

-------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය රු.631,057,480 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.550,500,998 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.80,556,482 ක වර්ධනයක් දක්නට ලැබුණි. දෙහිවල සත්වෝද්‍යානය හා පින්නවල අලි අනාථාගාරයේ ආදායම් පිළවෙලින් රු.86,539,782 කින් හා රු.5,256,614 කින් වැඩිවීම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2011 වර්ෂයේදී රු.373,338,295 ක්වූ අතිරික්තය 2015 වර්ෂය වනවිට රු.631,057,480 දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබුණි. ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂයවීම් හා බදු ගෙවීම් සැලකිල්ලට ගැනීමේදී 2012 වර්ෂයේදී රු.420,557,041 ක් වූ දායකත්වය අඛණ්ඩව වර්ධනය වී 2015 වර්ෂය වනවිට රු.692,779,039 ක් වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

-------------------------

### 4.1 කාර්යසාධනය

-----------------

(අ) 1982 අංක 41 දරන ජාතික සත්වෝද්‍යාන පනත අනුව අරමුණු පහත පරිදි වේ.

(i) ජාතික සත්වෝද්‍යාන සංවර්ධන හා සුහසාධක අරමුදලේ පරිපාලනමය කටයුතු සඳහා නිලධාරීන් සහ සේවක පිරිසක් බඳවා ගැනීම.

(ii) දෙහිවල සත්වෝද්‍යානය නැරඹීම සඳහා පැමිණෙන්නන්ගේ වාහන නවතා තැබීම පිණිස විශේෂ පෙදෙස් සැපයීම.

(iii) සත්වෝද්‍යානයේ සේවා නියුක්තිකයන්ට සුහසාධන සහ දිරිගැන්වීමේ යෝජනා ක්‍රම සැලැස්වීම

(iv) සත්වෝද්‍යානය සම්බන්ධයෙන් වූ සියලු කාරණා හා ප්‍රශ්න පිළිබඳව අධ්‍යක්ෂවරයාට උපදෙස් දීමේ සහ අමාත්‍යවරයා වෙත නිර්දේශයන් කිරිමේ කාර්යය සඳහා අමාත්‍යවරයා විසින් උපදේශන කාරක සභාවක් පිහිටුවීම.

(v) ඉහත උපදේශක කාරක සභාවේ රැස්වීම් යටත් පිරිසෙයින් සෑම වර්ෂයකම දෙවරක් පැවැත්වීම.

(ආ) ක්‍රියාකාරී සැලැස්ම අනුව ව්‍යාපෘති 45 ක් සඳහා රු.565,000,000 ක මුදලක් ප්‍රතිපාදනය කර තිබුණද වැය කර තිබුණේ රු.246,420,391 ක් පමණි. සැලසුම් කරන ලද රු.මිලියන 39 ක වටිනාකමින් යුත් ව්‍යාපෘති 08 ක් කාලවකවානු දැක්වීමකින් තොරව කල්දමා තිබුණි.

**4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්**

**-----------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වර්ෂ දෙකක කාලපරිච්ඡේදයක් ඉක්ම වූ රු.1,959,900 ක ටෙන්ඩර් තැන්පතු සුදුසු පරිදි නිරවුල් කිරීමකින් හෝ ආදායමට ගැනීමකින් තොරව තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.

(ආ) එක් එක් සත්වෝද්‍යාන සඳහා වෙන් වෙන් වශයෙන් ආදායම් ප්‍රකාශන පිළියෙල නොකිරීම නිසා එකී සත්වෝද්‍යානවල සත්‍ය ලාභදායීතාවය හෝ පාඩුව නිරීක්ෂණය කළ නොහැකි විය.

(ඇ) අරමුදල විසින් සැපයුම්කරුවන්ගෙන් හා කොන්ත්‍රාත්කරුවන්ගෙන් රඳවා ගන්නා ලද එකතුව රු. 44,828,258 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**4.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

**--------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) උද්භිද උද්‍යාන හා පොදු විනෝදාත්මක කටයුතු අමාත්‍යාංශයට අදාල 2013 අගෝස්තු 16 දිනැති අංක අපම/13/1038/562/006 දරන අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි පින්නවල සත්වෝද්‍යානය ඉදිකිරීමට අදාල උපදේශන කොන්ත්‍රාත් සමාගමකට රු.10,976,195 ක නොගෙවිය යුතු ලෙස තීරණය කර තිබියදී ඊට පටහැනිව 2015 වර්ෂයේදී සංචාරක හා ක්‍රීඩා අමාත්‍යාංශය විසින් නිවැරදි නොවන සංදේශයක් ඉදිරිපත් කර ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගෙන උක්ත මුදල අදාල සමාගම වෙත ගෙවා තිබුණි.

(ආ) 2006 ජනවාරි 28 දිනැති අංක 08 දරන ජාතික ප්‍රසම්පාදන නියෝජිතායතන චක්‍රලේඛය ප්‍රකාරව හම්බන්තොට සෆාරි උද්‍යානයේ ඉදිකිරීම් සඳහා රු.157,570,248 ක පිරිවැය ඇස්තමේන්තුවක් මත මධ්‍යම ඉංජිනේරු කාර්යයන් පිළිබඳ උපදේශන කාර්යාංශයට ලංසු කැඳවීමකින් තොරව කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි. මධ්‍යම ඉංජිනේරු කාර්යයන් පිළිබඳ උපදේශන කාර්යාංශය මෙම කොන්ත්‍රාත්තුව අරමුදලේ අනුමැතියකින් තොරව වෙනත් ආයතන 03කට ලබාදී තිබුණු අතර මෙම ඉදිකිරීම සඳහා ගෙවීම් කිරීමේදී රු.49,614,290 ක වැඩිපුර ගෙවීමක් සිදුකර තිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය.

**4.4 හඳුනාගන්නා ලද පාඩු**

පින්නවල අලි අනාථාගාරයේ අලි වසුරු හා කුණු රොඩු ඉවත් කිරීම සඳහා කියුබ් 3½ ලොරි රථ යොදාගෙන තිබූ අතර ඒ සඳහා රු.3,685,696 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.

**4.5 දෘෂ්‍ය අක්‍රමිකතා**

පින්නවල අලි අනාථාගාරයේ ප්‍රවේශ මාර්ගයක් සැකසීම සඳහා ග්‍රැවල් පස් සැපයීම වෙනුවෙන් රු.502,500 ක් ගෙවා තිබුණු අතර සිදුකරන ලද විගණන පරීක්ෂාවේදී ග්‍රැවල් පස් සැපයීම සඳහා යොදාගත් වාහනවල අංක බස් රථ සහ වෑන් රථවලට අයත් ඒවා බව නිරීක්ෂණය විය.

**4.6 කාර්ය මණ්ඩල පරිපාලනය**

සත්වෝද්‍යාන සංවර්ධන හා සුභසාධක අරමුදල සඳහා මානව සම්පත් කළමනාකරණ සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**5.1 අභ්‍යන්තර විගණනය**

2015 වර්ෂය සඳහා සත්වෝද්‍යාන සංවර්ධන අරමුදලට අදාලව අභ්‍යන්තර විගණන අංශයක් නොතිබුණු අතර අමාත්‍යාංශය විසින්ද අරමුදලට අදාලව විගණන පරීක්ෂාවන් සිදුකර නොතිබුණි.

**5.2 ප්‍රසම්පාදන සැලැස්ම**

2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 ඡේදය ප්‍රකාරව ඉදිරි වර්ෂය සඳහා විස්තරාත්මක සැලසුමක් සහිතව අවම වශයෙන් වර්ෂ 03 ක් සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කළ යුතු වුවත් ජාතික සත්වෝද්‍යාන සංවර්ධන හා සුභසාධක අරමුදල සඳහා එකී උපදෙස් අනුගමනය කර නොතිබුණි.

**5.3 අයවැය ලේඛනමය පාලනය**

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත වියදම හා තථ්‍ය වියදම අතර විෂයයන් 11 ක් සම්බන්ධයෙන් සියයට 54 සිට සියයට 100 දක්වා සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොමැති බව නිරීක්ෂණය විය.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව වරින් වර අධ්‍යක්ෂ ජනරාල් වරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍රය | නිරීක්ෂණ |
|---|---|
| (අ) ස්ථාවර වත්කම් පාලනය | (i) ඉදිකිරීම් අවසන් වූ වහාම අගය ප්‍රාග්ධනිත කර ක්ෂය කර නොතිබීම.<br>(ii) සත්වෝද්‍යාන සංවර්ධන සුභසාධක අරමුදලින් හා දෙපාර්තමේන්තු වැය ශීර්ෂයන්ගෙන් එකම ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා වියදම් දරා ඇති බැවින් ප්‍රාග්ධනිත කිරීමේදී වත්කමක නියමිත අගය නිරූපනය වී නොතිබීම. |
| (ආ) අභ්‍යන්තර විගණනය | අරමුදලෙහි ගනුදෙනු සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණනයන් සිදු කර නොතිබීම. |
| (ඇ) ලේඛන පවත්වා ගෙන යෑම | සියලුම ස්ථාවර වත්කම්, කොන්ත්‍රාත් ගෙවීම් හා ප්‍රදර්ශන සතුන් පිළිබඳ විස්තර හා වටිනාකම් ඇතුළත් ලේඛන පවත්වා නොතිබීම. |
| (ඈ) මිලදී ගැනීම් | සතුන් සඳහා මසුන් මිලදී ගැනීමේදී නියමිත ක්‍රමවේද අනුගමනය කර නොතිබීම. |
| (ඉ) සතුන් අගය කිරීම හා වාර්තා පවත්වා ගෙන යාම | සතුන් අගය කිරීමේදී පිළිගත හැකි ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබූ අතර මියගිය සතුන් පිළිබඳව මුදල් රෙගුලාසි අනුව නියමිත වාර්තා පවත්වා නොතිබීම. |